පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2019

මගේ අංකය NP/3/2/4/EB/2019
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
උතුරු පළාත,
යාපනය.
**13.05.2019**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
උතුරු පළාත.

**උතුරු පළාත් පාසල් සේවක සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු දරණ සේවකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2014 (I) (2019)**

ඉහත සඳහන් තනතුර දරණ සේවකයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය එම තනතුරේ මේ වන විට බලගතුව පවතින සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 09 වන ඡේදය ප්‍රකාර **2019 ජුනි මස** පැවැත්වීමට නියමිත ය. මෙම විභාගය පැවැත්වෙන්නේ යාපනය දිස්ත්‍රික්කයේ ය.

**2. සුදුසුකම්:**

- අදාල තනතුරුවල සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි එම සේවයේ III වන ශ්‍රේණියේ සේවය කරන සේවකයන් 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම් කළ හැකිය.

**3. ඉල්ලුම්පත් :**

- ඉල්ලුම්පත් යොමු කළ යුතු අවසාන දිනය වනුයේ **27.05.2019** දිනයි.
- ඉල්ලුම්පත් මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් තම ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු අතර, ඒ අනුව සකස් කරන ලද ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, උතුරු පළාත, සෙම්මනි පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ඉල්ලුම්පත්‍රය යොමු කරන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ **"උතුරු පළාත් පාසල් සේවක සේවයේ III, වන ශ්‍රේණියේ තනතුරු දරණ සේවකයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014 (I) (2019)"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සපයා නැති අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව** :-

- අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයකටම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. ( pass port )

ඉහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අහිමි කිරීමේ බලය විභාග ශාලාධිපති සතුය.

## 5. අයදුම්පත් :-

ඉල්ලුම්පත්‍රය අංක 1 සිට 3 දක්වා ඇති ඡේද පළමු පිටුවෙත් අනෙක් ඡේද දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි **'ඒ 4'** ප්‍රමාණයේ කඩදාසියක පරිගණක මගින් සකස් කර නිවැරදි හා පැහැදිලි අත් අකුරු වලින් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත්‍රය සකස් කරන විට ආදර්ශ ආකෘතිය පරිදිම සකස් කළ යුතු අතර, අයදුම්පතේ ඡායා පිටපතක් හෝ පූර්ව අනුපිටපත් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙස අවවාද කරනු ලැබේ.

ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග දැන්වීමේ සඳහන් පරිදි හා ආදර්ශ අකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පත්‍රය සකස් කිරීම කෙරෙහි විභාග අපේක්ෂකයන් තම අවධානය යොමු කල යුතු අතර එම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තමා ළඟ තබා ගැනිම ප්‍රයෝජනවත් වනු ඇත.

**6.** ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු ඔහු/ඇය විභාගයට පෙනීසිටීම සඳහා සියළුම සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුය. විභාගයට පෙනී සිටින සේවකයන් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. එසේ සහතික කළ ප්‍රවේශපත්‍ර නැති අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට අවස්ථාව දෙනු නොලැබේ. යම් අපේකෂකයකුට විභාගය පැවැත්වීමට දින 03 කට ප්‍රථම ප්‍රවේශපත්‍ර ලැබුණෙ නැති නම් එම අපේකෂකයා විසින් පහත සඳහන් විස්තර සමඟ **පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ, ලේකම්** දැනුවත් කළ යුතුය.

- ආවරණ ලිපිය
- ඉල්ලුම් පත්‍රයේ පිටපත
- ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා දිනය
- ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය (Fax No)

**7.** මෙම විභාගයට පෙනී සිටින සේවකයන්ට, විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ආයතන සංග්‍රහයේ පරිච්ඡේද XII හා 19 වගන්තිය පරිදි කටයුතු කළ යුතුයි.

**8.** අපේක්ෂකයන් විභාගයෙන් සමත්වීමට සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලකුණු ලබාගත යුතුයි.

**9.** මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් සියළු දෙනාගේම විභාග ප්‍රතිපල උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් එවනු ලැබේ.

## 10. විභාග පටිපාටින්

පාසල් සේවක III වන ශ්‍රේණියේ තනතුරු දරණ සේවකයන්ගේ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේදී අදාල සේවකයන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු වාචික පරික්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ.

- අදාල සේවකයා තමා සේවය කරන පාසලේ තමා වෙත පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා තිබේදැයි මැන බැලීම

(ලකුණු 30)

- සුපුරුදු කාර්යාල ක්‍රම හා ආයතන පරිපාලන ක්‍රම පිළිබඳ තම සේවය සමග බැඳි දැනුම ලබා තිබේදැයි මැන බැලීම

(ලකුණු 30)

- මෙම සේවකයා වෙත පැවරී ඇති විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුම හා සාමාර්ථ්‍යතාවයක් ලබා තිබේ දැයි මැන බැලීම

(ලකුණු 40)

**11.** මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති තොරතුරු තම කලාපය යටතේ සේවය කරන සේවකයන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ මීට අමතරව මෙම තොරතුරු උතුරු පළාත් වෙබ් අඩවිය වන www.np.gov.lk හා උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.edumin.np.gov.lk යන ලිපිනයෙන් ද ලබා ගත හැකිය.

සටහන : මෙම විභාග දැන්වීම මගින් විධිවිධානය කර නැති යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගේ කිසියම් හෝ නොගැලපීමක් ඇති බව පෙනී යන්නේ නම් දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***සී. සත්‍යසීලන්,***

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය,

උතුරු පළාත.